# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2376/28 – 2024 මාර්තු මස 21 වැනි බ්‍රහස්පතින්දා – 2024.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2023/12.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ඒ. එම්. එස්. එම්. පී. එස්. අත්තනායක මහතා,
නිවාස අංක 05,
නිල නිවාස සංකීර්ණය,
සී/ස ලංකා සීනි සමාගම,
යාලබෝව,
වැල්ලවාය.

*සහ*

සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම,
පෞද්ගලික තැපැල් මල්ල,
බුත්තල.


1A – G 041630 – 09 (2024/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගැටහැත්ත, රාජ්‍ය සේවක ගම්මානය, B 27, පී. එච්. ආනන්ද මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඒ. එම්. එස්. එම්. පී. එස්. අත්තනායක මහතා,
නිවාස අංක 05,
නිල නිවාස සංකීර්ණය,
සී/ස ලංකා සීනි සමාගම,
යාලබෝව,
වැල්ලවාය.

*සහ*

සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම,
පෞද්ගලික තැපැල් මල්ල,
බුත්තල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

"සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගමෙහි සේවය කරන ඒ. එම්. එස්. එම්. පී. එස්. අත්තනායක මහතා 2021.03.05 දින වැඩ තහනම් කර පසුව 2022.05.03 වැනි දින නැවත සේවයෙහි පිහිටුවීමේ දී,

i. වැඩ මූලික තනතුර ජ්‍යෙෂ්ඨ විදුලි කාර්මික ලෙස පහත හෙළීම.
ii. 2022/2023/2024 වැටුප් වර්ධක විලම්භනය කිරීම.
iii. වැඩ තහනමට ලක් වූ කාලය සඳහා වැටුප් නොගෙවීම.
iv. අභ්‍යන්තර ස්ථාන මාරුවක් සිදු කිරීම.
v. ආයතනය විසින් පවත්වනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයේ අවසන් වාර්තාවේ පිටපතක් ලබා නොදීම.

යන කරුණු මඟින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද, කවර දා සිට ද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (වැ.බ.)

2024 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 03 – 0168

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.